# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.06 පැය 1025 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/661/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්‍ා වූ වැදගත් තොරතුරු</u>**

## 01. මාරක රිය අනතුරක් - මහබාගේ පොලිස් වසම

2025.04.05 වන දින සවස් කාලයේ මහබාගේ පොලිස් වසමේ වැලිසර ප්‍රදේශයේදී ජේකොප් මාවත අතුරු මාගර්යේ සිට පැමිණි කාර් රථයක් නිවසක් ඉදිරිපිට සෙල්ලම් කරමින් සිටි කුඩා දරුවන් තිදෙනෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ දරුවන් තිදෙනා රාගම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් දරුවෙකු මියගොස් ඇති අතර අනෙක් දරුවන් දෙදෙනා බරපතල තුවාල ලබා රාගම රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි.

**මියගිය දැරිය වයස අවුරුදු 05 ක් වූ වැලිසර, රාගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනතුර සිදු කරන ලද කාර් රථ රියදුරු යතුරුපැදිකරුවෙකු පසුසප හැප්පීම සඳහා හබා යන අවස්ථාවේ එම යතුරුපැදිකරු ඉන් බේරීම සඳහා අතුරු මාගර්යකට යොමු කර ඇති අතර යතුරුපැදිය හැප්පීම සඳහා කාර් රථය වම් පස වංගුවට ගන්නා අවස්ථාවේදී ඒ අසල නිවසක් ඉදිරිපිට සිටි කුඩා දරුවන් තිදෙනෙකු කාර් රථයේ ගැටීමෙන් මෙම අනතුර සිදුවී ඇත.

දැරියගේ මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් පසු කාර් රථයේ රියදුරු කාර් රථය අනතුර සිදු වූ ස්ථානයේ අතහැර දමා පලාගොස් ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා මහබාගේ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - පල්ලෙකැලේ පොලිස් වසම

2025.04.05 වන දින රාත්‍රී කාලයේ පල්ලෙකැලේ පොලිස් වසමේ මහනුවර පදියතලාව මාගර්යේ බලගොල්ල රතුකුරුස හන්දිය ආසන්නයේදී දිගන දෙස සිට මහනුවර දෙසට ධාවනය කළ කාර් රථයක් මාගර්ය හරහා ගමන් කළ පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් කාන්තාව බරපතල තුවාල ලබා පේරාදෙනිය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 76 ක් වූ කෙන්ගල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනතුරට සම්බන්ධ කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීරය පේරාදෙණිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පල්ලෙකැලේ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - මැල්සිරිපුර පොලිස් වසම

2025.04.06 වන අද දින අළුයම් කාලයේ මැල්සිරිපුර පොලිස් වසමේ දඹුල්ල කුරුණෑගල මාගර්යේ කොස්කැලේ ප්‍රදේශයේ දී දඹුල්ල දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ වෑන් රථයක් කාමරීක දෝෂයක් හේතුවෙන් මාගර්යේ අයිනෙහි නතර කර රියදුරු විසින් එම කාමරීක දෝෂය පරීක්ෂා කරන අවස්ථාවේ වෑන් රථයේ පැමිණි මගියෙකු වෑන් රථයෙන් බැස වෑන් රථයට ඉදිරියෙන් ගොස් රියදුරු අසුන ආසන්නයේ සිට වෑන් රථයේ ඇතුලතට විදුලි ආලෝකය ලබා දෙමින් සිට ඇත. එම අවස්ථාවේ දඹුල්ල දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ ලොරි රථයයක් වෑන් රථයේ පිටුපස ගැටී වෑන් රථයේ ඇතිල්ලී ගොස් රියදුරු අසුන සමීපයේ සිටි වෑන් රථයේ ගමන් ගත් මගියාගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පුද්ගලයා පොල්ගහවෙල රෝහලට ඇතුලත් කිරිමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 76 ක් වූ මාදිපොළ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොල්ගහවෙල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මැල්සිරිපුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**